රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **Combined Services Division**
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | *Independence Square, Colombo 07, Sri Lanka*

දුරකතනය / தொலைபேசி: 011- 2696211-13 / Telephone
ෆැක්ස් / தொலைநகல்: 011- 2695279 / Fax
ඊ- මේල් / மின்னஞ்சல்: info@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site


මගේ අංකය / எனது இல / My No: CS/ICTS/01/Vacancy XI
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.01.20

අමාත්‍යාංශ ලේකම්වරු
කොමිෂන්සභා ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරු

**<u>සේවක සංඛ්‍යා යාවත්කාලීන කිරීම</u>**
**<u>(ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, රජයේ භාෂා පරිවර්තක සේවය)</u>**

ඉහත සේවා සඳහා මෑතක දී බඳවාගැනීම් සිදු කර ඇති බැවින් ඉදිරි බඳවාගැනීම්වල දී පිරවීමට අවශ්‍ය පුරප්පාඩු සංඛ්‍යා තීරණය කර ගැනීම සඳහා ද සේවා ව්‍යවස්ථා යාවත්කාලීන කිරීම ඇතුළු අත්‍යාවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ සඳහා ද එම සේවාවල සේවක සංඛ්‍යා තොරතුරු නිශ්චිතවම ලබා ගැනීමට අවශ්‍ය වී ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව පහත සබැඳිය (link) උපයෝගී කරගෙන පළ කර ඇති Google පෝරමයට එම සේවක සංඛ්‍යා තොරතුරු 2025.01.31 දිනට පෙර යාවත්කාලීන කිරීමට ද පෝරමයේ 40 සහ 41 මගින් ඉල්ලා ඇති ලේඛන උඩුගත (Upload) කිරීමට ද කටයුතු කිරීම මැනවි. මෙහිදී ප්‍රාදේශීය කාර්යාල වෙතින් තොරතුරු ගෙන්වා යාවත්කාලීන කිරීමට අමාත්‍යාංශ ලේකම්වරු/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු අතර ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන් සෘජුව තොරතුරු ඇතුළත් කිරීම දත්ත විශ්ලේෂණයෙ දි ගැටලුකාරී වන බැවින් එසේ නොකරන ලෙස වැඩිදුරටත් දන්වමි.

03. මෙහිදී පහත කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතුය.

I. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තොරතුරු අදාළ දිස්ත්‍රික් ලේකම්වරු විසින් ඇතුළත් කළ යුතුය.
II. ජාතික පාසල්වල තොරතුරු ඇතුළත් කළ යුත්තේ අධ්‍යාපන අමාත්‍යාංශයීය ලේකම් විසිනි.
III. අමාත්‍යාංශ වල විවිධ අංශ සඳහා වෙනම කාර්ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත්තේ නම් එම තොරතුරු වෙන වෙනම එම අංශ මගින් ඇතුළත් කිරීම සුදුසු වේ.
    උදා :- ස්වදේශ කටයුතු අංශය
    පළාත් පාලන අංශය

මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් මෙම අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ VII ශාඛාව පහත දුරකථන අංක මගින් සම්බන්ධ කර ගත හැකි බව සැලකුව මැනවි.

සබැඳිය :- https://docs.google.com/forms/d/12M7jNguHl7CCt_EtmYP6kmZreHxjsX--a0lfiDozbxQ/edit

දුරකථන අංකය :- 0112699966

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්